ස්වේච්ඡාවෙන් ම ගණන් බේරා වසා දැමීම

ඉහත සඳහන් සමාගමේ කොටස්හිමියන් විසින් 2018 අගෝස්තු මස 03 වැනි දින පහත සඳහන් විශේෂ සහ සාමාන්‍ය යෝජනා සම්මතයන් සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. **විශේෂ යෝජනා සම්මතය**

ඉහත කී සමාගම, 2007 අංක 7 දරන සමාගම් පනතේ (''පනත'') 319 (1) (ආ) වගන්තිය ප්‍රකාරව ගණන් බේරා වසා දැමිය යුතු බවට යෝජනා සම්මත කරනු ලැබේ.

2. **සාමාන්‍ය යෝජනා සම්මතය**

ඉහත කී සමාගම ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා ජී. ජේ. ඩේවිඩ් මහතා අධ්‍යක්ෂවරුන් විසින් එකඟ වියයුතු වන පාරිශ්‍රමිකයකට යටත් ව, ඈවරකරු වශයෙන් පත්කළ යුතු බවටත්, 2007 අංක 7 දරන සමාගම් පනතේ 326 (2) වගන්තිය ප්‍රකාරව සීඑම්ඒ සීජීඑම් ෂෙයාර්ඩ් සර්විස් සෙන්ටර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ (''සමාගම'') අධ්‍යක්ෂවරුන්ගේ බලතල ක්‍රියාත්මක කිරීමට මෙයින් අවකාශ දී ඇති තාක් දුරට යටත්ව, ඈවරුකරුට, ඈවරකිරීම ආරම්භයෙන් පසුව,

*(අ)* ඉහත සමාගමේ බැංකු ගිණුම/ගිණුම් පවත්වාගෙන යාමට, (සාමාජික ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසාදැමීම සහ පශ්චාත් ගණන් බේරා වසාදැමීම. ප්‍රාග්ධන ප්‍රතිලාභයක් වශයෙන් බැංකුවේ තිබෙන අතිරික්ත අරමුදල් කොටස් හිමියාට/හිමියන්ට පැවරීම පිණිස අධ්‍යක්ෂවරුන් හා සම්බන්ධ යම් කවරම වූ වියදම් දැරීම පිණිස)

*(ආ)* විගණනය කළ ගිණුම්, අයබදු වාර්තා සහ ඉහත කී සමාගමේ ආශ්‍රිත ලේඛන අත්සන් කිරීමට.

*(ඇ)* ඉහත සමාගම නමින් යම් නඩුකර හෝ නඩුකටයුතු ගෙන ඒමට හෝ ඒ වෙනුවෙන් විත්ති වාචකය ඉදිරිපත් කිරීමට.

බලය ලබාදිය යුතු බවට යෝජනා සම්මත කරනු ලැබේ.

**3. සාමාන්‍ය යෝජනා සම්මතය**

ඇවරකරුගේ මරණයට හෝ දුබලතාවට පත්වුවහොත්, සීඑම්ජී සීජීඑම් ෂෙයාර්ඩ් සර්විස් සෙන්ටර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමෙන් විමසීමෙන් පසුව, ශ්‍රී ලංකාවේ කොළඹ 4, කාසල් පටුමගේ අංක 11, 3 වන මහල, එස්ජේඑම්එස් ඇසෝසියේට්ස් සමාගමේ වරලත් ගණකාධිකරීවරුන්ගේ වෙනත් හවුල්කරුවකු/ නම්කළ තැනැත්තකු පත්කළ යුතු බවට යෝජනා සම්මත කරනු ලැබේ.

සීඑම්ජී සීජීඑම් ෂෙයාර්ඩ් සර්විස් සෙන්ටර්
ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ
ලේකම්වරු වෙනුවෙන්.

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 216, ද සේරම් පෙදෙස,
කොළඹ,
ශ්‍රී ලංකාව.

08-661

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු

සමාගමේ නම : නෙක්සිස් ලොජිස්ටික්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 115623
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 28/ඒ, 5 වන පටුමග, කොළඹ 03
ලියාපදිංචි දිනය : 2016.08.09

සමාගමේ නම : වීනස් බිස්නස් ස්කූල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00201619
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 4/7, ගුණතිලක පාර, කොලන්නාව
ලියාපදිංචි දිනය : 2018.07.07

සමාගමේ නම : ටියෝකි ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202182
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 177, කදුබොඩ, දෙල්ගොඩ
ලියාපදිංචි දිනය : 2018.07.18

සමාගමේ නම : සවිය මයික්‍රෝ ක්‍රෙඩිට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202190
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : කොළනිය හංදිය, නාගොඩ පාර, කළුතර දකුණ
ලියාපදිංචි දිනය : 2018.07.18

සමාගමේ නම : ස්කයි ක්‍රෙඩිට් සොලුෂන්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202048
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 238/3/2, බැලුම්මහර, ඉඹුල්ගොඩ
ලියාපදිංචි දිනය : 2018.07.15

සමාගමේ නම : නෙට්ලන්ස් ටෙක්නොලොජිස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202325
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 186, මුල්ලේරියාව උතුර, අංගොඩ
ලියාපදිංචි දිනය : 2018.07.23

සමාගමේ නම : ඕක් ඉන්ටිග්‍රේටඩ් සිස්ටම්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202380
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : 26 අදියර, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, එච්ලොන් චතුරශ්‍රය, කොළඹ 01
ලියාපදිංචි දිනය : 2018.07.24

සමාගමේ නම : රෙඩ් සී ෆිෂ් ඩියුට්‍රිබියුටර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202356
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 330, නවෝදය මාවත, දැලතුරේ, ජා ඇල
ලියාපදිංචි දිනය : 2018.07.24

(ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු)

08-671

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු

සමාගමේ නම : අයිකොසර්ව් ඉංජිනියරින් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 118216
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය: අංක 469/බී/14, වැලිවිට, කඩුවෙල
ලියාපදිංචි දිනය : 2016.11.22

සමාගමේ නම : අයිකොනික් මීඩියා (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 131174
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 70/12/බී, වයි එම් බී ඒ ගොඩනැගිල්ල, කොළඹ 08
ලියාපදිංචි දිනය : 2018.03.27

සමාගමේ නම : වෙල්සිස් ඉංජිනියරින් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00201787
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 117/17, අනගාරික ධර්මපාල මාවත, මහනුවර.
ලියාපදිංචි දිනය : 2018.07.08

(ඉහත සඳහන් සමාගම් ලේකම්වරු)

08-672

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ෆිඩෙලිටි කැපිටල් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00202031
ලියාපදිංචි දිනය : 2018.07.15
ලියාපදිංචි ලිපිනය : අංක 568/ඒ/1, හල්ගහදෙණිය පාර, කලපලුවාව, රාජගිරිය.

සමාගමේ නම : වන්අරබන්ජංගල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202461
ලියාපදිංචි දිනය : 2018.07.26
ලියාපදිංචි ලිපිනය : අංක 69/9, කවුඩාන, අත්තිඩිය පාර, දෙහිවල.

ලේකම්.

08-676

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ලෝරන්ස් ඇන්ඩ් මයිකල් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 131501
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 1181/3/1, මාළඹේ පාර, කොට්ටාව, පන්නිපිටිය
ලියාපදිංචි දිනය : 2018.04.05

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

08 - 477

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : රෙඩ් බැලූන් ෆැමිලි රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී.වී. 00200307
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 104, හයිලෙවල් පාර, කොට්ටාව, පන්නිපිටිය
ලියාපදිංචි දිනය : 2018/05/16

සමාගමේ නම : රෙඩ් ලැන්ටන් ෆැමිලි රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී.වී. 00200309
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 166, හයිලෙවල් පාර, මහරගම
ලියාපදිංචි දිනය : 2018.05.17

සමාගමේ නම : බතික් සෙන්ටර් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී.වී. 00201180
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 15, ප්‍රධාන වීදිය, ගම්පහ
ලියාපදිංචි දිනය : 2018.06.22

සමාගමේ නම : ඉමින්රා ෆුඩ්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී.වී. 00201250
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 72/3ඒ, 'දීප්ති' ද සේරම් පෙදෙස, යක්කල පාර, ගම්පහ
ලියාපදිංචි දිනය : 2018.06.24

සමාගමේ නම : මාගෝකොරො (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී.වී. 00201651
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 76/බී, උඩුපිල, දෙල්ගොඩ
ලියාපදිංචි දිනය : 2018.07.07

සමාගමේ නම : වොලීනා ෆුඩ්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී.වී. 00201416
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 31/09 බී 1, සපුගස්තැන්න පාර, කළගෙඩිහේන
ලියාපදිංචි දිනය : 2018.07.01

සමාගමේ නම : අපේ රිසෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී.වී. 132119
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 144/බී/1/1, විජේකුමාරතුංග මාවත, කොළඹ 05.
ලියාපදිංචි දිනය : 2018.06.06

සමාගමේ නම : අපේ රිසෝර්ට්ස් ගල් ඔය (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී.වී. 00201229
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 425/11/ඒ, හැවුලොක් පාර, කොළඹ 06
ලියාපදිංචි දිනය : 2018.06.24

සමාගමේ නම : නිව් රංගල ට්‍රාන්ස්පෝට් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී.වී. 00200596
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 130/12, කිරුලපන මාවත, කොළඹ 05
ලියාපදිංචි දිනය : 2018.05.28

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

08 - 478

---

## දැන්වීමයි

පහත සඳහන් සමාගම් සංස්ථාගත කිරීම පිළිබඳව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ටී.එල්. රිටේල් සිස්ටම්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00200884
ලියාපදිංචි කාර්යාලය : අංක 20, බෝධිරාජ මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල.
සංස්ථාගත කළ දිනය : 2018 ජුනි 8

රජනි බාලක්‍රිෂ්ණන් මිය,
සමාගම් ලේකම්.

08 - 496

---

## ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ නිවේදනය

කොළඹ 06, මැනිං පෙදෙසෙහි, සී. ඩී. අයි. එපාර්ට්මන්ට් හි අංක 8/4 හි පදිංචි ශ්‍රීකාන්තන් ජෙයමලාර් වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නාගරාජේශ්වරී සිවපාදම් විසින් සහතික කරන ලදුව යාපනය, නල්ලූර්හි රානි වීදියෙහි අංක 16 හි පදිංචි තර්මලිංගම් ජෙයනාන්දන් වෙත ලබාදෙන ලද අංක 69 සහ 2000.02.27 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය 2017 ජුනි මස 17 වැනි දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ/අවලංගු කරන බව ශ්‍රී ලංකාවේ පොදු මහජනතාව වෙත මෙයින් නිවේදනය කර සිටිමි.

08-509

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : බැටිකලෝ ඩිස්ට්‍රික්ට් ආරුචි වුමෙන්ස් නෙට්වර්ක්
සමාගමේ අංකය : ජී ඒ 3428
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 305, ටිංකෝ පාර, බැටිකලෝ
සංස්ථාගත කිරීමේ දිනය : 2017.12.27

ලියාපදිංචි ලේකම්වරු.

08-541/1

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : ඊ එස් එල් ඉලෙක්ට්‍රෝඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 125064
සමාගමේ ලියාපදිංචි කාර්යාලය :70, ඩෙවිඩ්සන් පාර, කොළඹ 04
සංස්ථාගත කිරීමේ දිනය : 2017.08.28

ලියාපදිංචි ලේකම්වරු.

08-541/2

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සිලෝන් ස්පයිස් බුටික් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි කාර්යාලය : අංක 09, සුගතබිම්බාරාම පාර, පෝරඹ, අම්බලන්ගොඩ
සංස්ථාගත කළ දිනය : 2018 ජූලි 10
ලියාපදිංචි අංකය : පී වී 00201831

නුවන් චන්ද්‍ර ගුණතිලක,
සමාගම් ලේකම්.

08-543

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එච් එන් ජී කන්ට්‍රැක්ටර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00201861
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : ''වාසනා'' මාහේන කඳපහළ, දෙවුන්දර
ලියාපදිංචි දිනය : 2018.07.11

සමාගමේ නම : ග්ලෝබල් ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00201888
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 22/2, ඥාණවිමල මාවත, අතුරුගිරිය
ලියාපදිංචි දිනය : 2018.07.11

සමාගමේ නම : රිවෙලේෂන්ස් ප්‍රොෆෙෂනල් එඩියුකේෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00201928
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 297/49, සී වී එස් කොරියා මාවත, හෝකන්දර දකුණ, හෝකන්දර
ලියාපදිංචි දිනය : 2018.07.12

සමාගමේ නම : එලිෆන්ට් අයිලන්ඩ් ටුවර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00202016
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 23/2, සුහද මාවත, ඔෆ් කෝට්ටේ, රජමහා විහාර පාර, පිටකෝට්ටේ
ලියාපදිංචි දිනය : 2018.07.15

ඒ ඇන්ඩ් ඩී ඇසෝසියේට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

(දුරකතන අංක : 2512514/2512400)
අංක 94/12, කිරුළපන ඇවනිව්,
කොළඹ 05.

(ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු)

08-548

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත නම සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

වෙළඳ සමාගමේ නම : ඕෂන්ස්වෙල්
ලියාපදිංචි අංකය : ජීජ් 3368
ලියාපදිංචි කළ දිනය : 2017.07.17
ලියාපදිංචි කාර්යාලය : අංක 131, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

සමාගම් ලේකම්වරු.

08-554

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව ඊටා - මෙල්කෝ ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ් නම ඒ ජී මෙල්කෝ එලෙවේටර් කම්පැනි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් නම වෙනස් කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙන්නෙමු.

පෙර පැවති නම : ඊටා - මෙල්කෝ ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 3788
ලියාපදිංචි ලිපිනය : අංක 04, ඇල්ෆ්‍රඩ් හවුස් ඇවනිව්, කොළඹ 03
සමාගමේ නව නම : ඒ ජී මෙල්කෝ එලෙවේටර් කම්පැනි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග ප්‍රකාර

සිලෝන් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

08-555

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි.

සමාගමේ නාමය : R. M. D. ෆීඩ් මිල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2017.12.21
ලියාපදිංචි අංකය : පී වී 128295
ලියාපදිංචි කාර්යාලය : අංක 549, දඹුලු පුර පාර, තේක්ක වත්ත, තඹුත්තේගම.

සමාගම් ලේකම්වරු.

08-569

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තියට අනුව පහත සමාගම් ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : රේනිබෝ එල්ඩර්කෙයාර් හෝම් (පීවීටී) එල්ටිඩී
ලිපිනය : අංක 33/5, අනුර මාවත, කළුබෝවිල, දෙහිවල
ලියාපදිංචි අංකය : පී වී 127545
ලියාපදිංචි දිනය : 2017.11.28

සමාගමේ නම : එඩාෆෝල් (පීවීටී) එල්ටීඩී
ලිපිනය : අංක 284/33/3, 5 වන හරස් පාර, ගැඩඹුවාන පාර, මිරිස්වත්ත, පිළියන්දල
ලියාපදිංචි අංකය : පී වී 128395
ලියාපදිංචි දිනය : 2017.12.26

සමාගමේ නම : ටැග් වෙයාර් (පීවීටී) එල්ටීඩී
ලිපිනය : අංක 135, තක්ෂිලා උයන, මූණගම, හොරණ
ලියාපදිංචි අංකය : පී වී 128764
ලියාපදිංචි දිනය : 2018.01.10

සමාගමේ නම : සවුත් ඒෂියා සෙන්ටර් ඔෆ් එක්ස්සලන්ස් (පීවීටී) එල්ටීඩී
ලිපිනය : අංක 19 ඒ, පන්සල පාර, කළුබෝවිල, දෙහිවල
ලියාපදිංචි අංකය : පී වී 129222
ලියාපදිංචි දිනය : 2018.01.25

සමාගමේ නම : රන්වේ මොඩ්ල් ඇකඩමි (පීවීටී) එල්ටීඩී
ලිපිනය : අංක 58, මැදවැලිකඩ පාර, පරණ කෝට්ටේ පාර, රාජගිරිය
ලියාපදිංචි අංකය : පී වී 131426
ලියාපදිංචි දිනය : 2018.04.19

සමාගමේ නම : ඉන්දි ෆැෂන්ස් (පීවීටී) එල්ටීඩී
ලිපිනය : අංක 22, ස්ට්‍රැම්ෆර්ඩ් මාවත, කිරුළපන, කොළඹ 05
ලියාපදිංචි අංකය : පී වී 00200537
ලියාපදිංචි දිනය : 2018.05.28

සමාගමේ නම : ගෝල්ඩන් ඉන්ෆිනිටි ඉන්වෙස්ට්මන්ට් සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී
ලිපිනය : අංක 10, කදන හන්දිය, හොරණ
ලියාපදිංචි අංකය : පී වී 00200957
ලියාපදිංචි දිනය : 2018.06.14

සමාගමේ නම : ෆර්නි ක්‍රාෆ්ට් ඉන්ටීරියර්ස් (පීවීටී) එල්ටීඩී,
ලිපිනය : අංක 8/2, ඉහළ ඉඳිබැද්ද, මොරටුව
ලියාපදිංචි අංකය : පී වී 00201963
ලියාපදිංචි දිනය : 2018.07.13

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-593

---

## මහජනතාව වෙත දනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පෞද්ගලික සමාගම 2018 ජූලි මස 11 වැනිද පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : දක්ෂිණ කැපිටල් හෝල්ඩංස් පෞද්ගලික සමාගම
සමාගමේ අංකය : පී වී 00201871
ලියාපදිංචි කාර්යාලය : අංක 473/3බී, කෝ - ඔපරේටිව් රෝඩ්, පෙලෙන්වත්ත, පන්නිපිටිය.

සමාගම් ලේකම්.

08-590

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ටොප්කැෂ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00201662
සංස්ථාපිත දිනය : 2018 ජූලි මස 07 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 451, නුවර පාර, කැලණිය.

සමාගම් ලේකම්.

08-594

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කැළණිය, නාතුඩුව, අංක 67/4 හි පදිංචි මනන දෙවගේ මහේෂ් කුමාර (ජා. හැ. අංක 700560333 වී) වන මම, මා විසින් කැළණිය, නාතුඩුව, අංක 67/4 හි පදිංචි මනන දෙවගේ සිරිසේන (ජා. හැ. අංක 443131744 වී) යන අයට ප්‍රදානය කරන ලද ගම්පහ බර්නාඩ් හෙට්ටිආරච්චි ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ අංක 5896 සහ වර්ෂ 2004 ක් වූ අගෝස්තු මස 29 වැනි දිනැති ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා රජයටත්, පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි. තවද, එකී ඇටර්නි බලපත්‍රය යටතේ එකී ඇටර්නි බලකාර මනන දෙවගේ සිරිසේන යන අය යම් කාර්යයක් කරනු ලැබුවේ නම් ඒ සඳහා මා වග නොකියන බව ද මෙයින් දන්වා සිටිමි.

මනන දෙවගේ මහේෂ් කුමාර,
(ජා. හැ. අංක 700560333 වී)

08-625

---

## සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : බී ඇන්ඩ් ආර් ෆුවෙල් මාර්ට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 00201782
ලියාපදිංචි කාර්යාලය : අංක 444/4, රාජසිංහ මාවත, උඩුමුල්ල, මුල්ලේරියාව, නව නගරය
සංස්ථාපනය කිරීමේ දිනය : 2018.07.08

සමාගම් ලේකම්වරු.

08-628

## ඇටර්නි බලය අවලංගු කිරීම

මාගේ සේවාදායිකා මහරගම, පන්සල පාර, අංක 8 දරන ස්ථානයේ පදිංචි නුරානි යසාංජලි ගුණවර්ධන (වි.ග.බ.අ. GBR030057226) යන අය කොළඹ 06, කිරුලපන, එඩ්මන්ටන් පාර, අංක 9/2, දරන ස්ථානයේ පදිංචි ප්‍රමිලා දිවාකර (ජා. හැ. අ. 396690098V) යන අයට ප්‍රසිද්ධ නොතාරිස් සහ නීතිඥ ඉනෝකා ආර්. එම්. ගමගේ වන මා විසින් වර්ෂ 2007.10.02 වැනි දින ලියා සහතික කළ අංක 194 දරන ඇටර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් ක්‍රියාකිරීමට තිබූ බලය 2014.02.23 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරනු ලැබ ඇති අතර, එදිනට පසු ඇය විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට මාගේ සේවාදායිකාව වග නොකියන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත්, මෙයින් දැනුම් දෙමි.

එන්. වයි. ගුණවර්ධන

08-579

---

## දැන්වීමයි

වෝග් ටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී. වී. 13167)
සහ
ඉන්ටෙක්ස්මෝඩ් (පීවීටී) එල්ටීඩී (පී.වී. 74242)
සමාගම් හි යෝජිත ඒකාබද්ධ කිරීම

වෝග් ටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (ලියාපදිංචි අංක පී.වී. 13167) ඉන්ටෙක්ස්මෝඩ් (පීවීටී) එල්ටීඩී (ලියාපදිංචි අංක පී.වී. 74242) සමග 2007 අංක 07 දරණ සමාගම් පනතේ 239 වගන්තිය ප්‍රකාර යොජිත ඒකාබද්ධ කිරීම පිළිබඳව එකී පනතේ 241 (4) (ආ) උපවගන්තිය අනුව කරන ප්‍රසිද්ධ දැන්වීමයි.

වෝග් ටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ඒකාබද්ධ සමාගම ලෙස පවතින අතර ඉන්ටෙක්ස්මෝඩ් (පීවීටී) එල්ටීඩී සමාගමේ පැවැත්ම අවසන් වනු ඇත. 2018 අගෝස්තු 31 වන දින සිට ඉන්ටෙක්ස්මෝඩ් (පීවීටී) එල්ටීඩී සියලු වත්කම් සහ වගකීම් වෝග් ටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පැවරෙනු ඇත.

කොටස් හිමිකරුවෙකු, සුරැකුම් සහ ණය හිමියකු හෝ මහජනයා විසින් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරන කාල වේලාවන්හිදී පරීක්ෂා කර බැලීම පිණිස මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ඉහත සඳහන් කවර පුද්ගලයකු විසින් හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගම් වලින් ඉල්ලා සිටි විට ගාස්තු රහිතව එය ලබා ගැනීමේ හැකියාව ඇත.

වෝග් ටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ඉන්ටෙක්ස්මෝඩ් (පීවීටී) එල්ටීඩී

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි සමාගම් ලේකම්වරු

08- 588

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලව්ලි කිඩ්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 00202178
ලියාපදිංචි කාර්යාලය : අංක : 927/ඒ, කඩවත පාර, රාගම
ලියාපදිංචි දිනය : 2018.07.18

වෝටර්ස් සෙක්‍රටේරියල් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී

08-505

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 320 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනය

නිෂියා කෝපරේෂන් ලිමිටඩ්

සමාගම් අංකය : පී බී 5147
සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඇවර කිරීම

සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඇවර කිරීමක් වශයෙන් මෙම සමාගම ඇවර කිරීමටත්, කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 141/3 දරන ස්ථානයේ වරලත් ගණකාධිකාරි රාජපක්ෂ පතිරන්නැහැලාගේ වසන්ත චමින්ද රාජපක්ෂ මහතා සමාගමේ ඇවරකරු වශයෙන් වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 13 වැනි දින සිට පත් කිරීමටත්, විශේෂ යෝජනා සම්මතයක් වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 13 වැනි දින අනුමත කරන ලද බවත්, 2007 අංක 7 දරන සමාගම් පනතේ 319 (1)(ආ) දරන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. පී. ඩබ්ලිව්. සී. රාජපක්ෂ,
ඇවරකරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

08-633/1

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : බිනුලි ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00201134
සමාගම සංස්ථාපනය කළ දිනය : 2018.06.20
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 295/4, ඉහළ බියන්විල, කඩවත, ශ්‍රී ලංකාව.

නීතිඥ කේ. ඒ. එම්. එච්. කොඩිතුවක්කු
සමාගම් ලේකම්.

08-642

**2007 අංක 7 දරන සමාගම් පනතේ 346 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනය**

නිෂියා කෝපරේෂන් ලිමිටඩ්

සමාගම් අංකය : පී බී 5147
ඇවරකරුවකු පත්කිරීමේ නිවේදනය

වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 13 වැනි දින නිෂියා කෝපරේෂන් ලිමිටඩ් සමාගමේ ඇවරකරු වශයෙන් සමාගමේ විශේෂ යෝජනා සම්මතයෙන් මා පත් කරන ලද බව කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 141/3 දරන ස්ථානයේ වරලත් ගණකාධිකාරි රාජපක්ෂ පතිරන්නැහැලාගේ වසන්ත චමින්ද රාජපක්ෂ වන මම මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. ඩබ්ලිව්. සී. රාජපක්ෂ,
ඇවරකරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

08-633/2

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 320 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනය**

නිෂියා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංකය : පී වී 85505
සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඇවර කිරීම

සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඇවර කිරීමක් වශයෙන් මෙම සමාගම ඇවර කිරීමටත්, කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 141/3 දරන ස්ථානයේ වරලත් ගණකාධිකාරි රාජපක්ෂ පතිරන්නැහැලාගේ වසන්ත චමින්ද රාජපක්ෂ මහතා සමාගමේ ඇවරකරු වශයෙන් වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 13 වැනි දින සිට පත් කිරීමටත්, විශේෂ යෝජනා සම්මතයක් වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 13 වැනි දින අනුමත කරන ලද බවත්, 2007 අංක 7 දරන සමාගම් පනතේ 319 (1)(ආ) දරන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. පී. ඩබ්ලිව්. සී. රාජපක්ෂ,
ඇවරකරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

08-634/1

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 346 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනය**

නිෂියා හෝල්ඩිංස් (ප්‍රයිවට්)ලිමිටඩ්

සමාගම් අංකය : පී වී 85505

ඇවරකරුවකු පත්කිරීමේ නිවේදනය

වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 13 වැනි දින නිෂියා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඇවරකරු වශයෙන් සමාගමේ විශේෂ යෝජනා සම්මතයෙන් මා පත් කරන ලද බව කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 141/3 දරන ස්ථානයේ වරලත් ගණකාධිකාරි රාජපක්ෂ පතිරන්නැහැලාගේ වසන්ත චමින්ද රාජපක්ෂ වන මම මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. ඩබ්ලිව්. සී. රාජපක්ෂ,
ඇවරකරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

08-634/2

---

**ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම**

හෝමාගම ගොඩගම, අංක 167 පදිංචි දෝන දුෂ්මන්ති ද අල්විස් ජයසිංහ (දෝන දුෂ්මන්ති ද අල්විස් විද්‍යාරත්න ලෙසද හැඳින්වෙන) වන මා විසින් හෝමාගම, ගොඩගම, අංක 167 පදිංචි මකුලේමඩ බුලත්වත්තේ ගෙදර මල්ලිකා ජයසිංහ යන අය වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. සුනේත්‍රා ධර්මතිලක මහත්මිය විසින් සහතික කරන ලද 2012 නොවැම්බර් මස 26 දිනැති, අංක 087 දරන ඇටර්නි බලපත්‍රය මෙම දිනයේ පටන් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. තවද එම මකුලේමඩ බුලත්වත්තේ ගෙදර මල්ලිකා ජයසිංහ යන අය විසින්, එකී ඇටර්නි බලපත්‍රය යටතේ එම දිනයෙන් පසු මාගේ නමින් හෝ මා වෙනුවෙන් හෝ කරනු ලබන කිසිදු කාර්යයකට හෝ ගනුදෙනුවකට මාගේ කිසිදු වගකීමක් නොමැති බවද දන්වා සිටිමි.

දෝන දුෂ්මන්ති ද අල්විස් ජයසිංහ.

08-734

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

| *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි දිනය* | *ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය* |
|---|---|---|---|
| ෆැෂන් ඩිසයිං කවුන්සිල් ලංකා (ගරන්ටි ලිමිටඩ්) | ජී එල් 00202383 | 2018.07.24 | අංක 6 දොන් කරෝලිස්, කොළඹ 5 |

ෆයිනැන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-666

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

මිග/ප්‍රා. ලේ./01/11/රා රේන්ද 2019.

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදෙස් මත්පැන් රේන්ද විකිණීම - 2019

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව විදෙස් මත්පැන් විකිණීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් තැබෑරුම්වලට 2019 ජනවාරි මස 01 වැනි දින සිට 2019 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත් 2018.09.21 වැනි දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති තැන්පත් මුදල තැන්පත් කල බවට ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය කුවිතාන්සිය ද, ප්‍රකාශිත රා රෙන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකය ද, (වත්කම් සහතිකය ඔබ ඉදිරිපත් කරන ටෙන්ඩර් වටිනාකමින් 15%කට නොඅඩු විය යුතු ය) ඊට අදළ ඔප්පුවේ ජයා පිටපතක් ද, සහිතව ඉදිරිපත් කල යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ අංක .................... දරන ........................ විදෙස් මත්පැන් හල සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2018.09.21 දින පෙරවරු 10.30 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

04. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 2018.09.21 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. අදාළ හා අත්‍යාවශ්‍ය කරුණු සම්පූර්ණ කොට නොමැති ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර්පත් සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ විදෙස් මත්පැන්හල් නැවත විකිණීම 2018.11.26 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

08. ටෙන්ඩරය පිරිනමන ලද තැනැත්තා "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප. ව. 3.00 ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

09. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.
(දුරකතන අංක 031 2224633).

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

ඒ. කේ. ආර්. අලවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2018 ජූලි මස 30 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුමේ අංකය සහ නම* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘතව තැබිය යුතු වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01. | මීගමුව | අංක 02 ග්‍රීන් බාර් විදෙස් මත්පැන් හල | අංක 08 කොට්ඨාසයේ කුණ්ඩන්විල පමණක් | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 3,000 | 2018.09.21 පෙ. ව. 10.30 |

08-504

---

**අඹගමුව කෝරළයේ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2019 වර්ෂය**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට යටත්ව 2019 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා අඹගමුව ප්‍රාදේශීය ලේකම් විසින් 2018.09.19 වැනි දින පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

*(ආ)* ඇප මුදලක් ද වශයෙන් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදලක් ද තැන්පත් කර ලබාගන්නා නිල කුවිතාන්සිය; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ අතිරේක ආණ්ඩුවේ ඒජන්තගෙන්/ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ

වත්කම් පිළිබඳ සහතික කිරීම පිළිබඳ යථෝක්ත විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි සැළකිලිමත් විය යුතු ය ඃ

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි පහත සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්වල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝරම සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි වූ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා, සීල් තබා, කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංක හා නම සඳහන් කර, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ ශීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවේ ටෙන්ඩර්කරුවන් අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන්, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක්, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් නමින් ගිනිගත්හේන මහජන බැංකුවේ වර්ෂයක ස්ථිර තැන්පත් ගිණුමක රඳවා ගැනීමට එකඟ විය යුතු ය. මෙම තැන්පතු මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් ''ආරක්ෂිත චෙක්පත්'' ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් ඒවා 2018.11.09 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ යුතුය.

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2018 ජූලි මස 04 වැනි දින,
ගිනිගත්හේන අඹගමුව කෝරළයේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

*විදේශ මත්පැන් තැබෑරුම් :*

| *අංකය* | *තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| 01. | නෝර්වුඩ් | නෝර්වුඩ් නගර බල ප්‍රදේශය අංක 03 තුළ | 2018.09.19 පෙ. ව. 10.30 | රු. 5,000 |
| 02. | දික්ඔය | හැටන් දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 04 තුළ | 2018.09.19 පෙ. ව. 10.30 | රු. 5,000 |
| 03. | දික්ඔය | හැටන් දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 05 තුළ | 2018.09.19 පෙ. ව. 10.30 | රු. 5,000 |

08-697

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### හැටන් නැෂනල් බැංකුව - හල්ස්ඩ්‍රොෆ් ශාඛාව

අංක 1990 අංක 04 දරන පනත මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේපත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ නවගමුව ගමේ පිහිටි චන්ද්‍රගරවත්ත නමැති ඉඩමේ ලොට් අංක 24 හි ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් දෙළහයි දශම අටයි පහක් (අ. 0 රූ. 0 පර්. 12.85) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද සමග වේ.

වෙදදේවගේ ජගත් රුවන් කුමාර ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දවූ ද, 2007.07.24, 2007.06.11 දිනැතිව පිළිවෙලින් අංක 2802 සහ 3231 දරන බැඳුම්කරයන් යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුව සුරක්ෂිත කර ඇත.

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2018 සැප්තැම්බර් මස 06 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2010.02.25 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද, 2010.02.24 වැනි දින පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - බොරැල්ල හංදියේ සිට ඔරුගොඩවත්ත හන්දිය දක්වා දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතට පැමිණ දකුණට හැරී අවිස්සාවේල්ල පාර (පරණ පාර) දිගේ වැල්ලම්පිටිය කඩුවෙල පසුකර නවගමුව හන්දිය දක්වා යන්න. ඉන් පසුව දකුණට හැරී සුමනතිස්ස මාවතට පැමිණ මීටර් 500ක් පමණ දුර යන්න. එතැන සිට වමට හැරී එල්. බී ෆිනෑන්ස් ලිමිටඩ් විසින් විකුණනු ලබන බිම් කට්ටිය ඇති පාර දක්වා පැමිණි විට මෙම දේපළ හමුවේ. මෙම දේපල කට්ටි 11 ලෙස හඳුන්වයි. බත්තරමුල්ල හා කැලණිය පැත්තෙන් ද මේ දේපළට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු රු. 2,000 ද.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව, පී. එල්. සී. වෙත ගෙවා නිමකළ යුතු ය. ප්‍රධාන කළමනාකරු (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැංකුව, පී.එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 ට ගෙවිය යුතු ය.

දුරකතන අංක : 011 02661823, 011-2661815.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුලත නොගෙවුහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත. ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු/සාමවිනිසුරු,
(මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංක : 011- 2053286,
0720-881044/0723- 207533.

08-669

---

## ලංකා බැංකුව - නාරාහේන්පිට ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

1. ණය යොමු අංක : 78392063 සහ 80211530
   ජංගම ගිණුම් අංක : 6232659

කොළොන්නාව, පිරිවෙන පාරේ, අංක 7 ඒ හි ප්‍රීති ප්‍රදීප් ලියනගේ මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017.11.24 දිනැති අංක 2047 දරන ගැසට් පත්‍රයේ හා 2017.11.13 දින දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් යන පුවත්පත් වල පළ කරන ලද නිවේදන වලට අනුකූලව මුල් ණය මුදල් වල ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2018.09.07 වැනි දින පෙ. ව. 10.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලෙපත්තුවේ, කඩුවෙල මහා නගර සභා සීමාවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 491/A වල්පොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වල්පොල ග්‍රාමයේ පිහිටි වල්පොල පාරේ වරිපනම් අංක 107/2 දරන දෙල්ගහවත්ත සහ සියඹලාගහවත්ත එහෙත් සියඹලාගහවත්ත ලෙස ලියාපදිංචි කර ඇති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. කස්තුරිආරච්චි විසින් සාදන ලද 2011 සැප්තැම්බර් මස 16 දිනැති අංක 4751 දරන පිඹුරෙහි ලොට් 1 E1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1E1, උතුරට : අංක 331 දරන පිඹුරෙහි ලොට් 1D ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අංක 7958 දරන පිඹුරෙහි ලොට් සී ද, බස්නාහිරට : අංක 331 දරන පිඹුරෙහි ලොට් 1D ද මායිම්ව එකී අංක 4751 දරන පිඹුරට අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

එකී ලොට් 1E1 පහත විස්තර කොට ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

එකී වල්පොල පිහිටි සියඹලාගහවත්ත ලෙස ලියාපදිංචි කර ඇති දෙල්ගහවත්ත සහ සියඹලාගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද 1993 මැයි මස 10 දිනැති අංක 331 දරන පිඹුරෙහි ලොට් 1E ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1E, උතුරට : එකී අංක 331 දරන පිඹුරෙහි ලොට් 1D ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අංක 7958 දරන පිඹුරෙහි ලොට් C ද, බස්නාහිරට ලොට් 1D ද මායිම්ව එකී අංක 331 දරන පිඹුරට අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සහිත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 345/11 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

ජී. එල්. එස්. එස්. හේරත්,
කළමනාකරු.

ලංකා බැංකුව,
නාරාහේන්පිට ශාඛාව.

08-694

## ලංකා බැංකුව - තිස්සමහාරාමය ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක : 78577067/5612983.

වීරවිල, පන්නෙගමුව, අංක 258 හි පදිංචි පී. ඒ. සිතාර සම්පත් මහතා සහ අමරාවතී ජයසිංහ මහත්මියට අයත් උකස් කරන ලද දේපල විකිණීම.

ලංකා බැංකු ආඥපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 සැප්තැම්බර් මස 29 දිනැති අංක 2039 දරන ගැසට් පත්‍රයේ හා 2017 සැප්තැම්බර් මස 19 වැනි දින ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2018 සැප්තැම්බර් මස 14 වැනි දින පෙ. ව. 11.30 ට කොළොන්නාව විහාර මාවතේ, අංක 50/3 හි වෙන්දේසිකාර ටී. කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුවේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ දඹේවෙලහේන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වීරවිල පිහිටි "පුහුල්පෝරුව" නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එන්. කේ. නානායක්කාර විසින් සාදන ලද 2010 නොවැම්බර් මස 11 දිනැති අංක 19/2010 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම උතුරට : පාර ද, නැගෙනහිරට : ISPPI හි ලොට් 917 ද, දකුණට : එකී පිඹුරෙහි ලොට් B ද, බස්නාහිරට : මහ පාර ද මායිම්ව එකී අංක 19/2010 දරන එකී පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් දහසයක (අ. 0, රූ. 2, පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස්, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි ඇති වෙනත් සියලු දේ ද වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO K 11/53හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එච්. එම්. චින්තක මහතා,
ශාඛා කළමණාකරු.

ලංකා බැංකුව,
තිස්සමහාරාමය.

08-693

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

අයිරා යොමු අංකය - 73979559.
ණය යොමු අංකය - 78105772.

දෙහිවල, මල්වත්ත පාරේ, අංක 11 හි දැනට පදිංචි දෙහිවල, ගාලු පාරේ, අංක 173 හි සී/ස ඊබර්ට් සිල්වා ඔටෝමොබයිල් ඉංජිනියරින් (පුද්ගලික) සමාගමට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

අධ්‍යක්ෂවරු -

දෙහිවල හිල් වීදියේ, අංක 23 හි පදිංචි
1. සුධර්මා කාන්ති ද සිල්වා මිය
2. අගම්පොඩි රාජින්ද්‍ර ඊබර්ට් ද සිල්වා

ලංකා බැංකු ආඥපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017.12.29 දිනැති අංක 2052 දරන ගැසට් පත්‍රයේ හා 2017 දෙසැම්බර් මස 18 වන සඳුදා දින ''ඩේලිනිව්ස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2018.09.08 වැනි දින පෙ. ව. 10.30 ට කොළොන්නාව, විහාර මාවතේ අංක 182/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ නැගෙනහිර දෙහිවල අංක 19 කොටසෙහි දෙහිවල පිහිටි මල්වත්ත පාරේ, අංක 11A වරිපනම් අංකය දරන මල්වත්ත මහවත්ත සහ කැලණි ඕවිට නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්.ජේ. ජයවික්‍රම විසින් සාදන ලද 2009 මැයි 18 වැනි දිනැති අංක 2763 දරන පිඹුරෙහි ලොට් 5412 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5412 උතුරට : ලොට් 1, 1331, 1332 සහ 1330 ද, නැගෙනහිරට : ලොට් 5413 ද, දකුණට : මල්වත්ත පාර ද, බස්නාහිරට : ලොට් 1 සහ ලොට් 257 B ද මායිම්ව එකී අංක 2763 දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් හතයි දශම හයයි පහක (අ . 0, රූ. 2, පර්. 7.65) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති

හා වැඩෙන ගහකොළ සහ ගොඩනැගිලිවලින් යුක්ත වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Dehi 120/80, 81 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්.පී.ඒ. අබේවික්‍රම මහතා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
දෙහිවල අධිශ්‍රේණි ශාඛාව.

08-695

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය.

ටී. ඩී. ඩිස්ට්‍රිබියුටර්ස්
ගිණුම් අංක : 0035 1000 5359 සහ 0035 1000 5499

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008.07.24 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි නම ලක්ෂ අනූ හත් දහස් හයසිය තිස් අටයි ශත දෙකක (රු. 2,997,638.02) මුදල ද, 2008 මාර්තු මස 05 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි නම ලක්ෂ අනූ හය දහස් හයසිය තිස් අටයි ශත දෙකක (රු. 2,996,638.02) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.07.16 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2010.07.05 වැනි දින දිවයින, සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2018.09.14 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල මහ නගර සභා සීමාවන් තුළ ග්‍රැවට් හතර දංගෙදර ග්‍රාමයේ පිහිටි ඉහළ ඩික්සන් පාර වරිපනම් අංක 16 දරන ''පොකුණබොඩවත්ත'' නොහොත් පොකුණවලව්ව හි ලොට් 2'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. නාගහවත්ත යන අය විසින් සාදන ලද 1994 මාර්තු මස 31 දතම හා අංක 814 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන් කොට ලොට් 2 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 3 නැගෙනහිරට : ඉහළ ඩික්සන් පාර වරිපනම් අංක 20/1 දරන උළුගෙදරවත්ත සහ කුඹුල්ගේවත්ත සහ ඉහළ ඩික්සන් පාර වරිපනම් අංක 14/1 දරන ඔරප්පුවත්ත දකුණට : මෙම ඉඩමේ ලොට් 2 හි ලොට් 2 බී සහ ලොට් 2 සහ බස්නාහිරට : ඉහළ ඩික්සන් පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනයි දශම දෙකයි පහයි බිංදුවක් (අ. 0, රූ. 0 පර්. 33.250) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 814 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිුරුව ඒ 558/244 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

08-649

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. වී. යූ. සී. මල්වත්ත සහ එස්. යූ. මල්වත්ත.
ගිණුම් අංක : 1215 5460 3116.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2017.05.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි තිස් තුන් ලක්ෂ හැත්තෑ හය දහස් හයසිය අනූ හතරයි ශත දහයක (රු. 13,376,694.10) මුදල ද, 2017 මැයි 09 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි විසි දෙලක්ෂ හැට දෙදහස් හාරසිය තිස් හතයි ශත විසි හයක (රු. 12,262,437.26) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම පහක් (10.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක්

වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2017.09.15 දින රජයේ ගැසට් පත්‍රයේ 2017.09.25 දින ''දිවයින'' සහ ''තිනකුරල්''සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2018.09.10 වැනි දින ප. ව. 1.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොල ඕතොට කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේගොඩ, (උතුර) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මාදලගම පිහිටි "හීල්බත්කුඹුරේ පිල්ලැව දූන් වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්.එස්. චන්ද්‍රරත්න යන අය විසින් සාදන ලද 2007 මාර්තු 04 දතම හා අංක 12/2007 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 4 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජයතිලක හා වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : ජයතිලක හා වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, දකුණට : ප්‍රධාන පාරේ සිට නිවාස දක්වා පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට : අංක 12/2007 දරන එකී පිඹුරේ ලොට් 03 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම අටයි හතරක් (අ. 0, රූ. 0, පර්. 16.84) ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග එකී අංක 12/2007 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව T 16/109 (වෙනත් කරුණු තීරුව) යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 4 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොල ඕතොට කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේගොඩ (උතුර) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මාදලගම ග්‍රාමයෙහි පිහිටි "හීල්බත්කුඹුරේ පිල්ලැව දූන් වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. ඒ. පද්මදාස යන අය විසින් සාදන ලද 2001 මැයි 31 දතම හා අංක 2366 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් 1B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ජයතිලක හා වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : ජයතිලක හා වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, දකුණට : කුරුණෑගල සිට නිවාස දක්වා පාර (ගම් සභා පාර) සහ බස්නාහිරට : අංක 2366 දරන එකී පිඹුරේ ලොට් 1A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම අටයි හතරක් (අ. 0, රූ. 0, පර්. 16.84) ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2366 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව T 16/109 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-648

---

## කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - පොල්ගහවෙල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### පළවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොළ ඔටෝටා කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බරහැලගමුව ග්‍රාම නිලධාරි වසමේ, බරහැලගමුව ගමේ හි පිහිටි "ගිරා අඹේ ඕවිට" දූන් වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු A. A. පද්මදාස විසින් 2010 නොවැම්බර් මස 24 වැනි දින සාදන ලද අංක 5971 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ප්‍රමාණය රූඩ් එකයි පර්චස් විසිඅට (අ.0, රූ.1, පර්.28) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ පිහිටි සියලුදේත් සමග වේ.

### දෙවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොළ ඔටෝටා කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බරහැලගමුව ග්‍රාම නිලධාරි වසමේ, බරහැලගමුව ගමේ හි පිහිටි "මාවතවත්ත ලෙස හැඳින්වෙන ගිරාඅඹේහිටිනාවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු A. A. පද්මදාස විසින් 2006 අප්‍රේල් මස 22 වැනි දින සාදන ලද අංක 4164 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ප්‍රමාණය පර්චස් හතරයි දශම අටයි බිංදුව (අ.0, රූ.0, පර්.4.80) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ පිහිටි සියලුදේත් සමග වේ.

### තුන්වන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොළ ඔටෝටා කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව

තුළ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බරහැලගමුව ග්‍රාම නිළධාරි වසමේ, බරහැලගමුව ගමේ හි පිහිටි "බෙලිගහමුලවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු A. A. පද්මදාස විසින් 2010 දෙසැම්බර් මස 13 වැනි දින සාදන ලද අංක 5986 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ප්‍රමාණය පර්චස් දහතුනයි දශම පහයි හතර (අ.0, රූ.0, පර්.13.54) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ පිහිටි සියලුදේත් සමග වේ.

### හතරවන උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොළ ඔටෝටා කෝරලේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බරහැලගමුව ග්‍රාම නිළධාරි වසමේ බරහැලගමුව ගමේ හි පිහිටි "හිටිනාවත්ත, කෝන්ගහමුලවත්ත, දිවල්ගහමුලවත්ත සහ පින්නගොල්ලේ කොන්ගහමුලවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු A. A. පද්මදාස විසින් 1998 මාර්තු 30 වැනි දින සාදන ලද අංක 1228 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ප්‍රමාණය රූඩ් එකයි පර්චස් අට (අ.0, රූ.1, පර්.8) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ පිහිටි සියලුදේත් සමග වේ.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොළ ඔටෝටා කෝරලේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බරහැලගමුව ග්‍රාම නිළධාරි වසමේ බරහැලගමුව ගමේ හි පිහිටි "හිටිනාවත්ත, කෝන්ගහමුලවත්ත, දිවල්ගහමුලවත්ත සහ පින්නගොල්ලේ කොන්ගහමුලවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු A. A. පද්මදාස විසින් 1998 මාර්තු 30 වැනි දින සාදන ලද අංක 1228 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අට (අ.0, රූ.1, පර්.8) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ පිහිටි සියලුදේත් සමග වේ.

රූපසිංහ රයිස් මිල්ස් යන නමින් තනි පුද්ගල වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සිංහලගේ චන්ද්‍රලාල් රූපසිංහ ණයකරු ලෙස කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත සඳහන් කළ 1, 2, 3 සහ 4 උපලේඛනවල සඳහන් දේපළ

1 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ.0, රූ.1, පර්.28) වර්ෂ 2018 ක්වූ සැප්තැම්බර් මස 03 වැනි දින පෙ.ව. 11.00 ට

2 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ.0, රූ.0, පර්.4.80) වර්ෂ 2018 ක්වූ සැප්තැම්බර් මස 03 වැනි දින පෙ.ව. 11.15 ට

3 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ.0, රූ.0, පර්.13.54) වර්ෂ 2018 ක්වූ සැප්තැම්බර් මස 03 වැනි දින ප.ව. 12.30 ට

4 වන උපලේඛනයේ සඳහන් දේපළ ලොට් 1 (අ.0, රූ.1, පර්.8), ලොට් 2 (අ.0, රූ.1, පර්.8) වර්ෂ 2018 ක්වූ සැප්තැම්බර් මස 03 වැනි දින ප.ව. 1.00 ට

ඉහත ස්ථානවලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.07.06 වැනි දින රජයේ *ගැසට්* පතයේද, 2018.07.10 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2018.08.17 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*දේපළවලට පිවිසීම-*

1 වන උපලේඛනය .- පොල්ගහවෙල කොමර්ෂල් බැංකු ශාඛාවේ සිට කොළඹ කුරුණෑගල පාරේ, කුරුණෑගල දෙසට කි.මී. 2ක් පමණ ගමන්කළ විට කහවත්ත ඇළ හංදිය හමුවේ. එතැනින් වමට ඇති නාරම්මල පාරේ මීටර් 600 ක් පමණ ගමන් කර දකුණට හැරුණුවිට බොරළු පාරක් හමුවේ. (දුම්රිය හරස් පාර ළඟ) එම පාරේ මීටර් 75ක් පමණ ගමන් කළවිට අදාළ දේපළ හරියටම එම පාරේ අවසානයේ පිහිටා ඇත. පිවිසුම් මාර්ගයේ වාහන ගමන්කළ හැක.

*2 වන උපලේඛනය.* - පොල්ගහවෙල කොමර්ෂල් බැංකු ශාඛාවේ සිට කොළඹ කුරුණෑගල පාරේ, කුරුණෑගල දෙසට කි.මී. 2ක් පමණ ගමන්කළ විට කහවත්ත ඇළ හංදිය හමුවේ. එතැනින් වමට ඇති නාරම්මල පාරේ මීටර් 600 ක් පමණ ගමන් කර දකුණට හැරුණු විට බොරළු පාරක් හමුවේ. (දුම්රිය හරස් පාර ළඟ) එම පාරේ මීටර් 25ක් පමණ ගමන් කළවිට දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත. පිවිසුම් මාර්ගයේ වාහන ගමන්කළ හැක.

*3 වන උපලේඛනය .-* පොල්ගහවෙල නගරයේ සිට කොළඹ-ත්‍රිකුණාමල ප්‍රධාන පාරේ කි.මී. 4ක් පමණ ගමන්කළ විට කහවත්ත ඇළ හංදිය හමුවේ. එතැනින් වමට හැරුණු විට ඇති ප්‍රධාන පාරේ නාරම්මලට පැමිණ මීටර් 600ක් පමණ ගමන්කළ විට ගිරාඹේ දුම්රිය නැවතුම්පළ හමුවේ. දුම්රිය නැවතුම්පළ හමුවට පසුවනවාත් සමගම දකුණට ඇති වාහන ගමන්කළ හැකි කරත්ත පාරේ කි.මී. 1ක් පමණ ගමන් කළවිට අදාළ දේපළට ළඟාවිය හැක. අදාළ දේපළ එම පාරේ දකුණු පැත්තේ ඉදිරිපසින් පිහිටා ඇත.

*4 වන උපලේඛනය* - පොල්ගහවෙල නගරයේ සිට කොළඹ-ත්‍රිකුණාමල ප්‍රධාන පාරේ කි.මී. 4ක් පමණ ගමන්කළ විට කහවත්ත ඇළ හංදිය හමුවේ. එතැනින් වමට හැරුණු විට ඇති ප්‍රධාන පාරේ නාරම්මලට පැමිණ මීටර් 600ක් පමණ ගමන්කළ විට ගිරාඹේ දුම්රිය නැවතුම්පළ හමුවේ. දුම්රිය නැවතුම්පළ හමුවට පසුවනවාත් සමගම දකුණට ඇති වාහන ගමන්කළ හැකි කරත්ත පාරේ මීටර් 500ක් පසු කර වමට හැරුණු විට ඇති වාහන ගමන් කළ හැකි කරත්ත පාරේ මීටර් 200ක් පමණ ගමන් කළවිට අදාළ දේපළ පාරේ ඉදිරිපසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු.2,000.00
5. ලිපිකරු හා සෝෂක වේතනය රු.500.00
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ පොල්ගහවෙල ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී, අංක 2/32, කුරුණෑගල පාර, පොල්ගහවෙල.

දුරකථන අංක : 037-2241528-9
ෆැක්ස් : 037-2241530

එල්. බී. සේනානායක
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන /ෆැක්ස් : 011-2445393.
ඊමේල් : senaservice84@gmail.com

08-644

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. - බණ්ඩාරවෙල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා පදිංචියට/ව්‍යාපාරයකට සුදුසු සියලු පහසුකම් සහිත දේපලක්, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල නගර සභා සීමාවන් තුළ කැබිල්ලවෙල ග්‍රාම නිලධාරි වසම හි කැබිල්ලවෙල ගමේ පිහිටි "දොඔගොඩැල්ලේපතන" නමැති ඉඩමට බලයලත් මානක ඩී. සුදත් අරුණ රංජන විසින් 2016.03.18 වැනි දින සාදන ලද අංක 2284බී දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් බී නැමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහ කොළ, වගාව ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 21

බලයලත් මානත එම්. ජේ. සේතුංග විසින් 1972.11.05 වැනි දින සාදන ලද අංක 1147 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් R1 (අඩි 30ක් පළල මාර්ග ප්‍රවේශය) උඩින් යටින් සහ ඔස්සේ පොදුවේ පාවිච්චි කිරීමේ සම්පූර්ණ අයිතියද සමගින්.

මෙම දේපළ පොන්නයියා ඥානනාතන් යන අය බන්ධනදායි වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.-* බණ්ඩාරවෙල නගරයේ එළවළු තොග වෙළඳ පොළ ස්ථානයේ සිට තුන් සැතපුම් පාරේ කි.මී. 1.1ක් පමණ ස්ප්‍රින් වත්ත පාර දක්වා ගමන් ගෙන දකුණට හැරී ස්ප්‍රින් වත්ත පාරේ මීටර් 125ක් පමණ ගිය පසු මෙම පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

2018 ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින පෙ.ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.06.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2018.05.31 දින ලක්බිම, අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වේනොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.-* කළමණාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී., අංක 260/2, 260/4, ධර්මවිජය මාවත, බණ්ඩාරවෙල.

දුරකථන අංක : 057 2 232 653 - 057 2232655

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
ෆැක්ස් : 081-2210595/ 071-8446374/ 071-496244.
e. mail. wijeratnejayasuriya@gmail.com

08-639

---

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව**

**අගනා නිවසක් සහිත දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මාතර දිස්ත්‍රික්කයේ දෙව්නුවර ප්‍රදීපාගාර පාරේ අංක 139 දරන ප්‍රමාණයෙන් අ.0, රූ.0, පර්.37.28 විශාල ඉඩම සහ එහි ඇති නිවස මෙහි පහත විස්තර දැක්වෙන දේපල මා විසින් 2018.09.27 පෙ.ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මාතර දිස්ත්‍රික්කයේ, දෙව්නුවර ප්‍රදීපාගාර පාරේ, වරිපනම් අංක 139 දරන "ගෙදරවත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්. පී. සුනිල් මහතා මැන සකස් කළ 2001.02.07 දින අංක 428 සැලැස්මේ කැබලි අංක 1 ලෙස පෙන්වා ඇති ප්‍රමාණයෙන් අ.0, රූ.0, පර්. 37.28ක් වූ බෙදාවෙන් කළ මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි නිවාස සමග වේ.

*මෙම දේපල උකසට තබා ඇත්තේ .-* දෙව්නුවර පදිංචි තරානා දර්ශනී ද සිල්වා සහ හික්කඩුව බද්දේගම පාරේ, අංක 9 සී හි පදිංචි වෙදආරච්චි පටබැඳිගේ ප්‍රේමාවතී නොහොත් ප්‍රේමා වෙදආරච්චි විසිනි.

*දේපළට පිවිසෙන මාර්ගය .-* මාතර නගරයේ සිට තංගල්ල පාරේ දෙව්නුවර, පන්සල දක්වා කි.මී. 6ක් ගොස් දකුණට හැරී පන්සල වටා ඇති වටරවුම් පාරේ මීටර් 30ක් පමණ ගොස් ප්‍රදීපාගාර පාරේ මීටර් 600ක් ගියවිට වම් පසින් මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු මිල තීන්දු කළ වහාම මතු දක්වා ඇති ගාස්තු මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%,
2. පළාත් පාලන බදු 1%,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
4. නියමිත එකතුකළ අගයමත රජයේ බදු (VAT),
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු රු. 1,500.00.
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 2,000.00

ගැණුම් මිලෙන් ඉතිරි 75% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට ගෙවා නිම කළ යුතුව ඇත.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 25% ක මුදල ආපසු නොගෙවීමටත් සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

මේ පිළිබඳ වැඩි විස්තර සහ හිමිකම් ඔප්පු හා අදාළ ලියවිලි මාතර, උයන්වත්ත, උයන්වත්ත වටරවුම් පාරේ, අංක 28 බී ලිපිනයේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ, දකුණු පළාත් කාර්යාලයේ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී වෙතින් ලබාගත හැකිය. දු. අංක 041-2226208/ 041-2226209, කුරුඳුවත්ත, වල්ගම, මාතර.

එන්. එච්. පී. පී. ආරියරත්න,
බලයලත් වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

දුරකතන අංක : 071-1885677/ 071-3281956.

08-651

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. - පොල්ගහවෙල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර

**ඉහත සඳහන් කළ උපලේඛනය**

| | | |
|---|---|---|
| 1. | යන්ත්‍රෝපකරණයේ නම | - ස්ටීම් රයිස් මිලින් ප්ලාන්ට් - 65XM - 189 |
| | මාදිලිය | - 6SXM - 189 |
| | අනුක්‍රමික අංකය | - C201404148 |
| | නිෂ්පාදිත රට | - චීනය |
| | ධාරිතාව | - 15,000kg/8hr |
| | නිෂ්පාදිත වර්ෂය | - 2014 |
| 2. | යන්ත්‍රෝපකරණයේ නම | - වර්ටිකල් ටියුබ් බෝයිලර් |
| | මාදිලිය | - 3000 L |
| | නිෂ්පාදිත රට | - දේශීය |
| | මිලදීගත් වර්ෂය | - 2009 |

| | | |
|---|---|---|
| 3. යන්ත්‍රෝපකරණයේ නම | - | වයිට රෝ රයිස් මිලින් ප්ලාන්ට් |
| ධාරිතාව | - | 27 Mt/8hr |
| නිෂ්පාදිත රට | - | චීනය |
| නිෂ්පාදිත වර්ෂය | - | 2014 |
| 4 යන්ත්‍රෝපකරණයේ නම | - | වෙයිට් බ්‍රිජ් |
| අනුක්‍රමික අංකය | - | NC00714220 |
| ධාරිතාව | - | 40 ටොන්ස් |
| 5 යන්ත්‍රෝපකරණයේ නම | - | රයිස් ෆ්ලර් මේකින් ප්ලාන්ට් |
| ලක්ෂණ | | 2 නම්බර්ස් ඔෆ් ග්‍රයින්ඩින් මැෂින්, සර්වර් විත් සයික්ලොන් 3 නම්බර්ස් ඔෆ් මෙකැනිකල් හලර්ස් ඇන්ඩ් පැනල් බෝඩ් |
| නිෂ්පාදිත රට | - | ඉන්දියාව |
| මිලදීගත් වර්ෂය | - | 2013 |

"රූපසිංහ රයිස් මිල්ස්" යන නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සිංහලගේ චන්ද්‍රලාල් රූපසිංහ ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත සඳහන් 1, 2, 3, 4 සහ 5 යන්ත්‍රෝපකරණ ආයිත්තම් අංක 1, 2, 3 සහ 4.

වර්ෂ 2018 ක් වූ සැප්තැම්බර් මස 03 වැනි දින පෙ.ව. 11.30 ට රූපසිංහ රයිස් මිල්ස්, අංක 143/A, ගිරාඹේ පොල්ගහවෙල යන ස්ථානයේ දී,

අයිත්තම් අංක 5

වර්ෂ 2018 ක් වූ සැප්තැම්බර් මස 03 වැනි දින ප. ව. 12.45 ට RGM ප්‍රඩක්ට්ස්, බරහැල්ගමුව පාර, ගිරාඹේ, පොල්ගහවෙල යන ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.07.06 වැනි දින රජයේ *ගැසට්* පත්‍රයේද, 2018.07.10 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා දින රජයේ *ගැසට්* පත්‍රය ද 2018.08.17 ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම-*

(1) ආයිත්තම් අංක 1, 2, 3 සහ 4 සවිකර ඇති රූපසිංහ රයිස් මිල්ස්, අංක 143/A, ගිරාඹේ, පොල්ගහවෙල ස්ථානයට පිවිසීම සඳහා පොල්ගහවෙල, කොමර්ෂල් බැංකු ශාඛාවේ සිට කොළඹ කුරුණෑගල පාරේ කුරුණෑගල දෙසට කි.මී. 2ක් පමණ ගමන් කළවිට කහවත්ත ඇළ හංදිය හමුවේ. එතැනින් වමට ඇති නාරම්මල පාරේ මීටර් 600 ක් පමණ ගොස් දකුණට හැරුණු විට ඇති බොරළු පාරේ (දුම්රිය හරස්පාර අසල) මීටර් 30 ක් පමණ ගමන්කළ විට අදාළ දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත. පිවිසුම් මාර්ගයේ වාහන ගමන් කළ හැක.

(2) ආයිත්තම් 5 සවිකර ඇති ස්ථානය වන R. G. M. ප්‍රඩක්ට්ස්, බරහැල්ගමුව පාර, ගිරාඹේ, පොල්ගහවෙල ස්ථානයට පිවිසීම සඳහා පොල්ගහවෙල නගරයේ සිට කොළඹ - ත්‍රිකුණාමලය ප්‍රධාන පාරේ, කි. මී. 4 ක් පමණ ගමන් කළවිට කහවත්ත ඇළ හංදිය හමුවේ. එතැනින් වමට හැරුණුවිට ඇති ප්‍රධාන පාරේ නාරම්මලට පැමිණ මීටර් 600ක් පමණ ගමන්කළ විට ගිරාඹේ දුම්රිය නැවතුම්පළ හමුවේ. දුම්රිය නැවතුම්පළ හමුවීමට පෙර කි. මී. 1ක් පමණ ගමන් කළවිට අදාල දේපළට ළඟාවිය හැක. අදාළ දේපළ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය : විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු යඃ

1. ගැණුම්කරු විසින් එදින සම්පූර්ණ මුදල් ගෙවා යන්ත්‍රෝපකරණ ඉවත්කර ගත යුතු යි,
2. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
3. නොතාරිස් ගාස්තුව රු.2,000.00,
4. ලිපිකරුගේ හා සෝෂක වේතන රු.500.00,
5. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න කළමණාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී., අංක 2/32, කුරුණෑගල පාර, පොල්ගහවෙල.

දුරකථන අංක : 037-2241528-9.
ෆැක්ස් : 037-2241530.

එල්. බී. සේනානායක
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන /ෆැක්ස් : 011-2445393.
ඊමේල් : senaservice84@gmai.com

08-645

---

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
(ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින්වූ )

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 289 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, ඒරාවූර් පත්තු - වෙන්කලඩි ප්‍රාදේශීය සභා සීමාවට සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, වෙන්කලඩි ග්‍රාම නිලධාරී වසමේ, වෙන්කලඩි ග්‍රාමයේ පිහිටි සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද උතුර සිට දකුණට අඩි 48ක්ද, නැගෙනහිර සිට බටහිරට අඩි 96ක් ද වන මැතකදී සිදු කරන ලද මැනීමකට අනුව බලයලත් මිනින්දෝරු වී. රාජේන්තිරන් විසින් සාදන ලද 24.09.2009 දිනැති අංක R/535/2009 දරන පිඹුරේ වඩා හොඳින් විස්තර කෙරෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණයඃ අක්. 00 රූඩ්. 00, පර්. 16.33
එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියලුම අයිතීන් සහිතව.

මෑතකදී කරන ලද නැවත මිනුමකට අනුව ඉහත ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, ඒරාවූර් පත්තු- වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඒරාවූර් පත්තු - වෙන්කලඩි ප්‍රාදේශීය සභා සීමාවට අයත්, වෙන්කලඩි ග්‍රාම නිලධාරී වසමේ වෙන්කලඩි ග්‍රාමයේ පිහිටි, බලයලත් මනින්දෝරු කේ. කමලනාදන් විසින් සාදන ලද 2015.10.05 දිනැති අංක KK/BT/2015/500 J දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණයඃ අක්. 00, රූඩ්. 00, පර්.15.37
එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියලුම අයිතීන් සහිතව.

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එන්. ක්‍රිස්ටිනා නීරුජා විසින් සහතික කරන ලද 2016 මැයි මස 31 දිනැති අංක 289 දරන උකස්කරය ප්‍රකාර වෙන්කලඩි පදිංචි පොඩියප්පු පුන්නියරාජා සහ පරමලිංගම් චන්ද්‍රකලා යන අය විසින්

ඩී එෆ් සී සී බැංකුව පී එල් සී ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ.

ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින්

2018 සැප්තැම්බර් මස 04 වැනි දින (අඟහරුවාදා) පෙ.ව. 11.00 පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය ඃ-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) සහ එම කොමිස් මුදලට අදළ සියලුම බදු,
4. රු. 161,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමත්නනඃ දුරකතන අංක 011-2371371.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 126 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය ඃ*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකතන අංකය ඃ 081 - 2227593.
දුරකතන/ෆැක්ස් අංකය ඃ 081-2224371.
ඊමේල් ඃ schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය ඃ*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08.
දුරකතන අංක ඃ 011-2671467, 011- 2671468.
දුරකථන/ෆැක්ස් අංකය ඃ 011- 2671469.
ඊමේල් ඃ schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-513

---

**යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

**පළවන උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ අංක 531 දරන දකුණු තොඩුවාව ග්‍රාම නිලධාරි

වසමේ, දකුණු තොඩුවාව ගමේ පිහිටි අංක එල් 480 දරන නුගහගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් මැන සාදන ලද අංක 3122 ඒ සහ 2014.03.11 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 01 දරන බිම් කොටසට (බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් මැන සාදන ලද අංක 3122 සහ 2003.09.26 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 3 දරන බිම් කොටසේ නැවත මැන බෙදීමක් වන)

ප්‍රමාණය රූඩ් දෙකකුත් පර්චස් තිහයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 30.50)

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 169/02 දරන වෙළුමේ/ පත්‍රිරුවේ ලියාපදිංචි කරන ලදුව, වර්තමානයේ කේ 169/104 දරන වෙළුමට/පත් ඉරුවට ගෙන ගොස් ඇත.

### දෙවන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ අංක 531 දරන දකුණු තොඩුවාව ග්‍රාම නිලධාරි වසමේ, දකුණු තොඩුවාව ගමේ පිහිටි අංක එල් 480 දරන නුගගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් මැන සාදන ලද අංක 3122 සහ 2003.09.26 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක 02 දරන බිම් කොටස.

ප්‍රමාණය රූඩ් එකකුත් පර්චස් පහළොවයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 1, පර්. 15.25)

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 187/55 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

### තෙවන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ අංක 532 - ඒ දරන උතුරු තොඩුවාව ග්‍රාම නිලධාරි වසමේ, උතුරු තොඩුවාව ගමේ පිහිටි අංක ටී 476 දරන නුගගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් මැන සාදන ලද අංක 1775 සහ 1998.05.23 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක 01 දරන බිම් කොටස.

ප්‍රමාණය රූඩ් එකකුත් පර්චස් දහඅටක් (අ. 0, රූ. 1, පර්. 18)

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 138/47 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, දෙදෙනාම අඹකන්දවිල, නැගෙනහිර ඉරණවිල, ස්ථානයේ සහ උතුරු තොඩුවාව, පදිංචි වර්ණකුලසූරිය පටබැඳිගේ නන්දික සිතිර ෆොන්සේකා හෙවත් වර්ණසූරිය පටබැඳිගේ නන්දික සිතිර ෆොන්සේකා හෙවත් වර්ණකුලසූරිය පටබැඳිගේ නන්දික සිසිර ෆොන්සේකා හෙවත් වර්ණසූරිය පටබැඳිගේ නන්දික සිසිර ෆොන්සේකා යන අය සහ තොම්මගේ නාලිකා දිල්රුක්ෂි ප්‍රනාන්දු යන අය මෙහි මින්මතු ඇතැම් තැනක ''බන්ධනදායින්'' වශයෙන් හඳුන්වන) යන එකී බන්ධනදායින් විසින් හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ශ්‍රීනා නිලුක්ෂි තිසේරා විසින් සහතික කරන ලද 2016.10.03 අංක 2682, 2016.10.03 අංක 2684, 2016.10.03 අංක 2678 සහ 2016.10.03 අංක 2680 දින සහ අංක දරන උකස් බැඳුම්කරයන් ලියා අත්සන් කොට තබා පිළිවෙලින් මෙහි ඉහත පළමු වන, දෙවන සහ තුන්වන උපලේඛනවල සවිස්තරව දක්වෙන දේපළ ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් මෙහි මින්මතු දක්වෙන ආකාරයට කලින් කලට වාර ණය ආකාරයෙන් බැංකු ණය පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී ලියාපදිංචි අංක පීබී 676 පීකිව් දරන, වෙත අයවිය යුතු ඉහත කී වාර ණය පහසුකම සහ පොළිය ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි ඉහත උපලේඛනවල සවිස්තරව දක්වා ඇති දේපළ, යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව,

පළවන උපලේඛනය 2018 ක් වූ සැප්තැම්බර් මස 06 වන දින පෙ. ව. 10.30 ට

දෙවන උපලේඛනය 2018 ක් වූ සැප්තැම්බර් මස 06 වැනි දින පෙ. ව. 11.00 ට

තෙවන උපලේඛනය 2018 ක් වූ සැපැතැම්බර් මස 06 වැනි දින පෙ. ව. 11.45 ට

අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*පළවන සහ දෙවන උපලේඛනවල සඳහන් දේපළට පිවිසීම.* - කොළඹ සිට පුත්තලම ඒ 3 ප්‍රධාන මාර්ගයේ ඉදිරියට කිලෝ මීටර් 59.50ක් ගමන් කර මහවැව හන්දියට පැමිණ වම් අතට ඇති ඉරනවිල හරහා හලාවතට ගමන් කරන මාර්ගයට හැරී කිලෝමීටර් 03ක් පමණ ගමන් කරන්න. ඉන් පසු දකුණට ඇති පල්ලිය පාරට හැරී පල්ලිය දක්වා ඉදිරියට ගමන් කර එතැනින් දකුණට හැරී මීටර් 50ක් පමණ ගමන් කර නැවත වමට හැරී මීටර් 800ක් පමණ ගමන් කරන විට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

*තෙවන උපලේඛනයේ සඳහන් දේපළට පිවිසීම.* - කොළඹ සිට පුත්තලම ඒ 3 ප්‍රධාන මාර්ගයේ ඉදිරියට කිලෝමීටර් 59.50ක් ගමන් කර මහවැව හන්දියට පැමිණ වම් අතට ඇති ඉරනවිල හරහා හලාවතට ගමන් කරන මාර්ගයේ කෙළවරට පැමිණ මාර්ගය හරහා ඉහලින් දමා ඇති පාළම පසු කර ඉදිරියට කිලෝමීටරයක් පමණ ගමන් කර පිළිරුව හංදියට පැමිණ එතැනින් දකුණු අතට පැත්තට වන්නට ඇති ඉරණවිල පල්ලිය පාරේ කිලෝමීටර 1.5 ගමන් කර පල්ලිය අසලට පැමිණ එතැන් සිට තවත් මීටර් 150ක් ගමන් කර ඉදිරියට ගමන් කරන විට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය* .- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය :

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ඉතිරි සියයට අනුව 90% ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුලත යුනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න :

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 200, හල්ස්ඩෝෆ් වීදිය, කොළඹ 12.
දුරකතන අංක 077 3242954 - 0112 445393 - 077 - 3181891.

නීති දෙපාර්තමේන්තුව,
යුනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී,
අංක 64, ගාළු පාර,
කොළඹ 03.
දුරකතන අංක 011 2347100.

08-566

---

**ඩී එෆ් සී සී බෑන්ක් පී. එල්. සී.**

අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බෑන්ක් පී.එල්.සී. මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා සියලු පහසුකම් සහිත දේපලක් බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හපුතලේ 63ඒ ග්‍රාමනිලධාරි කොට්ඨාසය තුල හපුතලේ නගර සභා සීමාවේ හපුතලේගම ගමේ පිහිටි හපුතලේ එස්ටේට් නැමති ඉඩමට බලයලත් මානක විජිත සෙල්ලහේවා විසින් 2010.05.11 වැනි දින සාදන ලද අංක 2028 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 නැමති ඉඩම් කොටස හා එහි තුල පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 18.97.

*දේපළට පිවිසීම.* - හපුතලේ නගරයේ සිට කොළඹ පාරේ මීටර් 150ක් පමණ ගමන් කර වමට හැරී ආතර් සිරිසේන මාවතට පිවිස එම පාරේ මීර් 100ක් පමණ ගමන් ගෙන දකුණට හැරී කොන්ක්‍රීට් පාරේ මීටර් 60ක් පමණ ගිය පසු අදාල දේපල මෙම පාරේ වම් පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

මෙම දේපල බණ්ඩාරවෙල පදිංචි ආරුමගම් වරදරාස් යන අය බන්ධනදායී වශයෙන් ඩීඑෆ්සීසී බෑන්ක් පී එල් සී නමින් ප්‍රසිද්ද නොතාරිස් කේ. ජී. ද සිල්වා විසින් ලියා සහතික කරන ලද අංක 460, 2490, 1573, 2061 දරන බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැංකුවට (ඩීඑෆ්සීසී වර්ධන බැංකුවෙහි අනුප්‍රාප්තික) සුරක්ෂිත කර ඇත.

2018 ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින ප.ව. 2.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.06.29 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2018.06.14 වැනි දින දිවයින, දි අයිලන්ඩ් සහ 2018.06.19 වැනි දින තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.- කළමනාකරු නීති අංශය, ඩී එෆ් සී සී බෑන්ක් පී. එල්. සී. අංක 73, ඩබ් ඒ ඩී රාමනායක මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011-2371371.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක : 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකතන අංක : 081-2210595 / 071-8446374 / 071-4962449.

08-636

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පණතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 2181/758/181 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර**

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එප්පාවල කෝරලේ අංක 390 ඉහළ සියඹලාව ග්‍රාම නිලධාරී වසමේ, ඉහළ ග්‍රාමයේ (FVP 378) පිහිටි ගොඩඉඩම ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ඒ එම් බී රත්නසිරි විසින් සාදන ලද 2002 පෙබරවාරි මස 02 වන දිනැති 1031 දරණ පිඹුරේ ලොට් අංක 01 ලෙස දක්වෙන (FVP 378) හි ලොට් අංක 5 සහ 1AC හි කොටස් වන සහ 2001.01.21 දිනැති අංක Anu/Thalawa/Pra/1416 දරණ ජය භූමි පිඹුරේ දක්වෙන) බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක් -00, රූඩ් - 03, පර් -28

ඉහත කී අංක 1031 දරණ පිඹුරට අනුව එහි පිහිටි ගොඩනැගිලි, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව ඉහත ඉඩම පහත සඳහන් ඉඩමෙහි මෑතකදී සිදු කරන ලද නවතම මැනීමකි :

ඉහත කී උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු නුවරගම් කෝරළේ, අංක 390 ඉහළ සියඹලාව ග්‍රාම නිලධාරී වසමේ ඉහළගම ග්‍රාමයේ පිහිටි බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක් -00, රූඩ් - 03, පර් -28

ප්‍රසිද්ධ නොතාරිස් S. හපුතන්ත්‍රි, N. S. රණතුංග සහ B.S. අබේවික්‍රම විසින් සහතික කරන ලද 2014 ඔක්තොම්බර් මස 27, 2014 ඔක්තෝබර් මස 30, 2014 නොවැම්බර් මස 05 වන දිනැති අංක 2181/758/181 දරන උකස්කරයන් ප්‍රකාර, මහනුවර පදිංචි මේරි ඇන් ඩිලීෂියා වික්‍රමසිංහ සහ පතිරවත්තේ සමන් පතිරන හෙවත් පතිරනවත්තේ සමන් පතිරන (මින්මතු බද්ධ ණයගැතියන් ලෙස හැඳින්වෙන) විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපල ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2018 සැප්තැම්බර් මස 05 වැනි දින (බදාදා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදාල සියළුම බදු,
4. රු. 136,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු: 1000.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න.
දුරකථන අංක : 011-2371371.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 126 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593.
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
අංක 6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08.
දුරකථන අංක : 011-2671467, 011- 2671468.
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-512